**පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව**
**பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை**
**POLICE HEADQUARTERS, COLOMBO, SRI LANKA**

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. : 517
දුරකථනය / தொலைபேசி / Telephone : +94 (0) 11 24 21 750, +94 (0) 11 24 21 111 - 9
ෆැක්ස් / தொலைநகல் / Fax : +94(0) 11 24 46 174, +94(0) 11 24 40 440
ඊ-මේල් / மின் அஞ்சல் / E-mail : igp@police.lk, telligp@police.lk
website: www.police.lk

මගේ අංකය / எனது இல. / My No. : Staff DIG/IG/OUT/05/7923/20
ඔබේ අංකය / உமது இல. / Your No :
දිනය / திகதி / Date : 2020.11.03

# මාධ්‍ය නිවේදනයයි

**නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති කාලය තුළ රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අවසර දී ඇති පුද්ගලික ආයතනයක කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම**

2020.10.29 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/33/2020 දරණ ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති “ගෝලීය කොරෝනා වෛරස වසංගත තත්ත්වය පවතින අතරතුර දුරස්ථ රාජකාරී කටයුතු ඉටු කිරීමේ වැඩපිළිවෙල” යන චක්‍රලේඛය සහ 2020.10.28 දිනැති අංක 20/2020 දරණ “රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම” මැයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස්වලට යටත් ව රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය රාජකාරී කටයුතු නිරෝධායන ඇඳිරි නීතිය පවතින ප්‍රදේශවල ඉටු කිරීම සම්බන්ධව මෙම විධිවිධාන අදාළ වේ.

02. ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති ඉහත චක්‍රලේඛයෙහි ඡේද 01, 02 ඒ, 03 අ i, 03 ඇ, 04 i, 04 ii, 04 vii, 06 අ, 08 සහ 2020.04.18 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/20/20 දරණ චක්‍රලේඛය හා 2020.05.14 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/21/20 දරණ චක්‍රලේඛය කෙරෙහි වැඩිදුරටත් අවධානය යොමු කරවනු ලැබේ.

03. ඒ අනුව රාජ්‍ය / අර්ධ රාජ්‍ය / ව්‍යවස්ථාපිත මණ්ඩල / සංස්ථා සහ පුද්ගලික ආයතනවල සේවකයන් සේවයට කැඳවීම හා සේවයේ යෙදවීම සඳහා නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවල හා / හෝ ප්‍රදේශ හරහා ගමන් කිරීමට පහත සඳහන් ආයතනවල සේවකයන්ට තම සේවා හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත සමඟ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවයට කැඳවීමේ ලිපියක් ඇඳිරි නීති බලපත්‍ර වෙනුවට භාවිත කළ හැකි බව මෙයින් දැනුම් දෙමි.

04. එබැවින් මෙම ආයතන වල සේවකයන් කැඳවීම හෝ සේවයේ යෙදවීම සඳහා පොලිස් ස්ථාන මඟින් ඇඳිරි නීති බලපත්‍ර නිකුත් නොකරන බව ද දැනුම්දෙනු ලැබේ.

1. ජනාධිපති කාර්යාලය
2. අග්‍රාමාත්‍ය කාර්යාලය
3. සියලු ම අමාත්‍යාංශ
4. නීතිපති දෙපාර්තමේන්තුව
5. අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ ඒකකය
6. අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
7. අපනයන සංවර්ධන මණ්ඩලය
8. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
9. අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩල
10. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කොමිෂන් සභා
12. ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව
13. ආයුර්වේද දෙපාර්තමේන්තුව
14. ආයෝජන මණ්ඩලය
15. ආහාර දෙපාර්තමේන්තුව
16. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
17. ඕෂන්වීව් ඩිවලොප්මන්ට් (පුද්) සමාගම
18. කම්කරු දෙපාර්තමේන්තුව
19. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
20. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
21. කොළඹ කොටස් වෙළඳපොල සහ අනුබද්ධිත ආයතන
22. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
23. ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව
24. ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම
25. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
26. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
27. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා
28. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
29. ජාතික ජලජ සම්පත් සංවර්ධන අධිකාරිය (NARDA)
30. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
31. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
32. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
33. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
34. තැපැල් දෙපාර්තමේන්තුව
35. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල
36. දුම්රිය දෙපාර්තමේන්තුව
37. දුරකථන සේවා සැපයුම් ආයතන
38. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
39. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)
40. නාගරික ආයෝජන (පුද්) සමාගම
41. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
42. නාගරික සංවර්ධන අධිකාරිය
43. පහත් බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය
44. පළාත් ආණ්ඩුකාර කාර්යාලය
45. පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය
46. පාරිභෝගික සේවා අධිකාරිය
47. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
48. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
49. මධ්‍යම පරිසර අධිකාරිය
50. මහවැලි අධිකාරිය
51. මාර්ග සංවර්ධන අධිකාරිය
52. මිනුම්දෝරු දෙපාර්තමේන්තුව
53. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
54. රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව
55. රජයේ මුද්‍රණාලය
56. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

57. රාජ්‍ය ඔසුසල
58. රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව
59. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
60. රාජ්‍ය හා පෞද්ගලික මූල්‍ය ආයතන
61. ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
62. ලංකා ගමනාගමන මණ්ඩලය
63. ලංකා ධීවර වරාය සංස්ථාව (CFHC)
64. ලංකා ධීවර සංස්ථාව (CFC)
65. ලංකා නැව් සමාගම
66. ලංකා රෙස්ට්හවුස් (පුද්) සමාගම
67. ලංකා විදුලි (පෞද්) සමාගම
68. ලංකා විදුලිබල මණ්ඩලය
69. ලංකා සතොස ලිමිටඩ්
70. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
71. වනජීවී දෙපාර්තමේන්තුව
72. වාණිජ දෙපාර්තමේන්තුව
73. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
74. විභාග දෙපාර්තමේන්තුව
75. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
76. වෝටර්ස් එජ් ආයතනය
77. ශ්‍රී ලංකන් ගුවන් සමාගම
78. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව
79. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
80. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
81. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
82. ශ්‍රී ලංකා මහබැංකුව
83. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
84. ශ්‍රී ලංකා රේගුව සහ ආශ්‍රිත සේවා සපයන ආයතන
85. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ආශ්‍රිත සේවා සපයන ආයතන
86. සංචාරක මණ්ඩලය
87. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
88. සමාජ සේවා දෙපාර්තමේන්තුව
89. සමුද්‍රයීය පරිසර ආරක්ෂණ අධිකාරිය
90. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
91. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
92. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
93. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
94. සියලු ම මාධ්‍ය ආයතන
95. සියලු ම පළාත් පාලන ආයතන
96. සියලු ම පෞද්ගලික රෝහල්
97. සියලු ම රක්ෂණ සමාගම්
98. සියලු ම රාජ්‍ය හා පෞද්ගලික බැංකු
99. සියලු ම විදේශ තානාපති කාර්යාල
100. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
101. සී/ස ඛනිජ තෙල් ගබඩා පර්යන්තය
102. සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
103. සී/ස මිල්කෝ පෞද්ගලික සමාගම
104. සුරාබදු දෙපාර්තමේන්තුව
105. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
106. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
107. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

05. මෙම ලැයිස්තුවට ඇතුළත් නොවුව ද යම් අත්‍යවශ්‍ය විශේෂිත කාර්යයක් හෝ ව්‍යාපෘතියක් නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බව යම් රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාවක ප්‍රධානියා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර යම් සේවයකට කැඳවීමට කටයුතු කරන සේවකයන් සඳහා ඉහත විධිවිධාන අදාළ වන අතර, එසේ කැඳවන බව ආයතන ප්‍රධානියා හෝ බලය ලත් නියෝජිතයකු විසින් නිකුත් කරන ලිපියක් මඟින් සනාථ කර තිබිය යුතු ය. එසේ කැඳවීම සම්බන්ධව එම පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත ලිඛිතව දැනුම් දී අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකරගත යුතු වේ.

06. යම් රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ප්‍රධානියා හෝ බලයලත් නිලධරයකු විසින් ඉහත පරිදි තම සේවකයන් සේවයට කැඳවීම හෝ සේවයේ යෙදවීම සම්බන්ධව ලිඛිතව බලය ලබාදෙන අවස්ථාවක දී සේවකයන් අවම ප්‍රමාණයක් සේවයේ යොදවන ආකාරයට කටයුතු කළ යුතු බව ද සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශවලට යටත් ව ඔවුන් සේවයේ යොදවන බවට ද එම ලිපි අදාළ සේවකයන් විසින් අවභාවිත නොකරන බවට ද සහතික විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම එම ලිපිය නිකුත් කරන නිලධරයා සතු බව අවධාරණය කරනු ලැබේ.

07. එසේ වුව ද සේවා අවශ්‍යතාවයක් නොමැති ව ඇඳිරි නීති කාලය තුළ තම සේවා හැඳුනුම්පත අවභාවිත කරමින් හෝ ආයතන ප්‍රධානියා හෝ බලයලත් නිලධරයකු විසින් නිකුත් කරන ලද ලිපිය අවභාවිත කරමින් නිරෝධායන රීතීවලට පටහැනිව කටයුතු කරන තැනැත්තන්ට එරෙහිව සහ එවැනි අවස්ථාවල දී ඉහත ඡේද 06 පරිදි කටයුතු කිරීම පැහැර හරිමින් අදාල ලිපි නිකුත් කර තිබුණ හොත් එම නිලධරයන්ට එරෙහිව ද නිරෝධායන නීතිය අනුව කටයුතු කිරීමට පියවර ගන්නා බව වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

සී.ඩී. වික්‍රමරත්න
වැඩබලන පොලිස්පති

සී. ඩී. වික්‍රමරත්න
වැඩ බලන පොලිස්පති